| | | |
|---|---|---|
| දුරකථන<br>தொலைபேசி<br>Telephones | 011-2136600<br>011-2136650 | |
| ලේකම්<br>செயலாளர்<br>Secretary | 011-2136602 | |
| ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011-2876169<br>011-2876181 | |
| විද්‍යුත් තැපැල<br>மின் - அஞ்சல்<br>E-mail | info@psc.gov.lk | |
| වෙබ් අඩවිය<br>இணையத்தளம்<br>Website | www.psc.gov.lk | |

**රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය**
**அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்**
**OFFICE OF THE PUBLIC SERVICE COMMISSION**

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
**No. 1200/9, Rajamalwatta Road, Battaramulla**


මගේ අංකය / எனது இல. / My No. PSC/EST/03-01-32/06/2013
ඔබේ අංකය / உமது இல. / Your No. MPA/SSD/10/opSOR
දිනය / திகதி / Date 2020.07.08

ලේකම්
රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

<u>ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ විධායක සේවා ගණයේ ආණ්ඩුවේ අතිරේක රස පරීක්ෂක හා සැක කටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂක තනතුරු සඳහා වන සංශෝධිත බඳවා ගැනීමේ පටිපාටිය</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබේ සමාංක හා 2020.02.24 දිනැති ලිපිය හා බැඳේ.

02. යොමුගත ලිපියේ සඳහන් කරුණු සලකා බැලූ රාජ්‍ය සේවා කොමිෂන් සභාව, 2014.05.12 දින මෙම කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ විධායක සේවා ගණය (ආණ්ඩුවේ අතිරේක රස පරීක්ෂක) සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය සඳහා මෙහි ඇමුණුම 1 හි (පිටු 05 කින් සමන්විත) සඳහන් සංශෝධනයන් ඇතුළත් කිරීමට 2020.06.30 දින අනුමැතිය ලබා දී ඇති බව කාරුණිකව දන්වමි.

03. මේ පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, අදාළ සංශෝධනයන් බඳවා ගැනීම් පටිපාටියට ඇතුළත් කරන ලෙසත් වැඩිදුරටත් දන්වා සිටිමි.

ආර්.ඩී.පී.එස්. ධර්මසේන
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

පිටපත්

| | | |
|---|---|---|
| I. | ලේකම්, අධිකරණ, මානව හිමිකම් හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | - කරු. දැ.ගැ.ස. |
| II. | ලේකම්, ජාතික වැටුප් කොමිෂන් සභාව | - කරු. දැ.ගැ.ස. |
| III. | ආණ්ඩුවේ රස පරීක්ෂක, ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව | - කරු. අ.ක.ස. |
| IV. | ආයතන අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | - කරු. දැ.ගැ.ස. |

## ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ පෝෂ්‍ය විධායක සේවා ගණයේ ආණ්ඩුවේ අතිරේක රස පරීක්ෂක හා සැක කටයුතු ලේඛණ පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂක තනතුරු සඳහා වන සංශෝධිත බඳවා ගැනීමේ පටිපාටිය - පළමු වන සංශෝධනය

<table>
<tr><th>අනු අංකය</th><th>වගන්තිය</th><th>සංශෝධනය විය යුතු ආකාරය</th></tr>
<tr><td>1.</td><td>1.1</td><td>යොමු අංකය - ආ1/බ.ගැ.ප.2010 දිනය - 2012.06.29<br>GAD/AD/02/01(SE) 2019.12.10</td></tr>
<tr><td>2.</td><td>1.2</td><td>අමාත්‍යාංශය : අධිකරණ, මානව හිමිකම් හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය<br>යොමු අංකය - MOJ/E08/රප/බගැප දිනය - 2013.10.21<br>MOJ/E08/GAD/SOR/2019 2020.01.22</td></tr>
<tr><td>3.</td><td>1.3</td><td>යොමු අංකය: DMS/C/3/23/3 දිනය - 2012.04.30<br>DMS/1103 2014.07.17<br>DMS/1103/VII 2018.07.05</td></tr>
<tr><td>4.</td><td>1.4</td><td>යොමු අංකය: EST-2/RECRU/04/2392 දිනය - 2012.10.23<br>EST-2/RECRU/04/2392 2019.08.20</td></tr>
<tr><td>5.</td><td>1.5</td><td>යොමු අංකය: NSCC/4/32/2/SR-1 දිනය - 2013.01.23<br>NSCC/1/32/2/SR-1 2019.07.10</td></tr>
<tr><td>6.</td><td>1.6</td><td>යොමු අංකය : PSC/EST/03-01-32/06/2013 දිනය - 2014.05.12<br>පළමු සංශෝධනය : PSC/EST/03-01-32/06/2013 (රා.සේ.කො.ස.අනුමත දිනය)</td></tr>
<tr><td>7.</td><td>3.4</td><td>ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාව පදනම් කරගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැකිය.</td></tr>
<tr><td>8.</td><td>5.1</td><td>වැටුප් කේත අංකය : SL-3-2016</td></tr>
<tr><td>9.</td><td>5.2</td><td>වැටුප් පරිමාණය : රු.88,000-12x2700-120,400/-</td></tr>
<tr><td>10.</td><td>5.3</td><td><table><tr><td>ශ්‍රේණිය</td><td>ආරම්භක වැටුප් පියවර</td><td>ආරම්භක වැටුප් තලය (රු.)</td></tr><tr><td>විශේෂ</td><td>පියවර 01</td><td>88,000/-</td></tr></table></td></tr>
<tr><td>11.</td><td>6.1</td><td>කාර්යයන් යටතේ පහත අනු අංකයන්හි සඳහන් කරුණු දක්වා ඇති පරිදි සංශෝධනය විය යුතුය.<br><br>03. විද්‍යාගාරවල විශ්ලේෂණ කටයුතුවලට අදාළ වන පර්යේෂණ ක්‍රම දියුණු කිරීමට අවශ්‍ය උපදෙස් හා තාක්ෂණික දැනුම ලබා දීම.<br><br>04. විද්‍යාගාරවල පරිපාලනය සහ නියෝජ්‍ය රස පරීක්ෂක, ජ්‍යෙෂ්ඨ සහකාර රස</td></tr>
</table>

පරීක්ෂක හා සහකාර රස පරීක්ෂකවරුන්ගේ රාජකාරී කටයුතු අධීක්ෂණය කිරීම.

05. විද්‍යාගාරවල විශ්ලේෂණ කටයුතු සහ දෙපාර්තමේන්තුවේ පරිපාලනමය හා මූල්‍යමය කටයුතු අධීක්ෂණය කිරීම. එම කටයුතු මෙහෙයවීම සඳහා ආණ්ඩුවේ රස පරීක්ෂකට සහාය වීම.

06.නීති ක්ෂේත්‍රයේ නිලධාරීන්, පොලිස් නිලධාරීන්, අධිකරණ වෛද්‍ය නිලධාරීන්, මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් සහ වෙනත් විමර්ශන නිලධාරීන් සඳහා දේශන පැවැත්වීම හා පුහුණු කිරීම.

07. රජයේ සහ අනෙකුත් ආයතනවලට විශ්ලේෂණ, විමර්ශන හා උපදේශන සේවාවන් සැපයීම.

(ආණ්ඩුවේ අතිරේක රස පරීක්ෂක තනතුරු නාමයට පසුව පහත තොරතුරු ඇතුලත් කරන්න).

| අනුමත තනතුරු නාමය | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| සැක කටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂක | විශේෂ | 01 | 01. අධිකරණ නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන හා වෙනත් ආයතනවලින් සැක කටයුතු ලේඛන අංශයට ලැබෙන සැක කටයුතු ලේඛන හෝ පරිගණක අපරාධ හා සම්බන්ධ නඩු භාණ්ඩ හා අනෙකුත් සාම්පල් පිළිබඳ විශ්ලේෂණ කටයුතු අධීක්ෂණය කිරීම සහ බැරෑරුම් හා ජාතික වශයෙන් වැදගත් සිද්ධි සම්බන්ධ පරීක්ෂණ කටයුතුවලදී මූලිකත්වය ගෙන කටයුතු කිරීම හා එවැනි පරීක්ෂණ කටයුතු අධීක්ෂණය කිරීම.<br><br>02. අවශ්‍ය අවස්ථාවන්හිදී එම වාර්තා සම්බන්ධයෙන් අධිකරණවල විශේෂඥ සාක්ෂි දීම.<br><br>03. විද්‍යාගාරවල විශ්ලේෂණ කටයුතුවලට අදාළ වන පර්යේෂණ ක්‍රම දියුණු කිරීමට අවශ්‍ය උපදෙස් හා තාක්ෂණික දැනුම ලබාදීම.<br><br>04. විද්‍යාගාරවල පරිපාලනය හා සැක |

| | | |
|---|---|---|
| | | කටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ නියෝජ්‍ය පරීක්ෂක, සැක කටයුතු ලේඛණ පිළිබඳ ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර පරීක්ෂක සහ සැක කටයුතු ලේඛණ පිළිබඳ ආණ්ඩුවේ සහකාර පරීක්ෂකවරුන්ගේ රාජකාරි කටයුතු අධීක්ෂණය කිරීම.<br><br>05. විද්‍යාගාරවල විශ්ලේෂණ කටයුතු සහ දෙපාර්තමේන්තුවේ පරිපාලනමය හා මූල්‍යමය කටයුතු අධීක්ෂණය කිරිම. එම කටයුතු මෙහෙයවීම සඳහා ආණ්ඩුවේ රස පරීක්ෂකට සහාය වීම.<br><br>06. නීති ක්ෂේත්‍රයේ නිලධාරීන්, පොලිස් නිලධාරීන් සහ වෙනත් විමර්ශන නිලධාරීන් සම්බන්ධ පුහුණු කිරීමේ කටයුතු.<br><br>07. රජයේ සහ අනෙකුත් ආයතනවලට විශ්ලේෂණ, විමර්ශන හා උපදේශන සේවාවන් සැපයීම.<br><br>08. දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් කාර්යයන්. |
| 12. | 6.2 | ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :<br><br>ආණ්ඩුවේ අතිරේක රස පරීක්ෂක - 02<br>සැක කටයුතු ලේඛණ පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂක - <u>01</u><br><u>03</u> |
| 13. | 7.4.2. | සුදුසුකම්<br><br>7.4.2.1 මූලික සුදුසුකම්<br><br>(01) <u>ආණ්ඩුවේ අතිරේක රස පරීක්ෂක තනතුර සඳහා</u><br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති ආයතනයකින් විශ්ලේෂණ රසායන විද්‍යාව, ආහාර විද්‍යාව හා තාක්ෂණයට අදාළ ක්ෂේත්‍ර, අධිකරණ විද්‍යාව (ධූලක විද්‍යාව, මත් ද්‍රව්‍ය හා මනෝවර්තක, අණුක ජීව විද්‍යාව, පුපුරන ද්‍රව්‍ය, ගිනි විමර්ශන හා ගිනි අවි) ඖෂධ විශ්ලේෂණය, ජල තත්ත්ව පාලනය හා කළමනාකරණය, පරිසර විද්‍යව යන ක්ෂේත්‍රයන්ගෙන් එක් ක්ෂේත්‍රයක පශ්වාත් උපාධියක් හෝ රසායන විද්‍යා විෂයට අදාළ වන ව්‍යවහාරික රසායන විද්‍යාව හෝ එම දෙපාර්තමේන්තුවේ විෂය ක්ෂේත්‍රයට අදාළව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම් විසින් නිර්දේශ කරනු ලබන හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන රසායන විද්‍යා ක්ෂේත්‍රයේ |

| | | |
|---|---|---|
| | | පශ්චාත් උපාධියක් ලබා තිබීම.<br><br><u>සැක කටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂක තනතුර සඳහා</u><br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති ආයතනයකින් අධිකරණ විද්‍යාත්මක ලේඛන පරීක්ෂාව පිළිබඳ පශ්චාත් උපාධිය හෝ වෝහාරික පරිගණක තාක්ෂණය හෝ ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ විෂය ක්ෂේත්‍රයට අදාළව පරිගණක විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම.<br><br>(02) උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට විධායක නිලධර ගණයේ පළමු ශ්‍රේණියේ වසර පහ (05)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා පළමු ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වැටුප් වර්ධක පහ (05)ක් උපයාගෙන තිබීම.<br><br>(03) උසස් කිරීම් සඳහා සුදුසුකම් ලබන දිනට සුදුසුකම් ලබන සේවා ගණයේ/තනතුරුවලට අදාළ විධායක ශ්‍රේණියේ වසර දහ අට (18)කට නොඅඩු සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.<br><br>(04) උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ වාර්ෂික කාර්ය සාධනය සතුටුදායක හෝ ඉහළ මට්ටමක පැවතීම.<br><br>(05) උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් තිබීම හා විනයානුකූල දඬුවමකට ලක් නොවී තිබීම. |
| 14. | 7.4.2.2. | වෘත්තීය සුදුසුකම්:<br><br><u>ආණ්ඩුවේ අතිරේක රස පරීක්ෂක තනතුර සඳහා</u><br><br>(I) ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ 1 වන ශ්‍රේණියේ ආණ්ඩුවේ නියෝජ්‍ය රස පරීක්ෂක තනතුර දරණ අයෙකු විය යුතුය.<br><br><u>සැක කටයුතු ලේඛණ පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂක තනතුර සඳහා</u><br><br>(I) ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ සැක කටයුතු ලේඛණ පිළිබඳ ආණ්ඩුවේ නියෝජ්‍ය පරීක්ෂක තනතුර දරණ අයෙකු විය යුතු ය. |
| 15. | 7.4.2.3. | කායික සුදුසුකම්:<br><br>ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය. |
| 16. | 7.4.3. | වයස : අදාළ නොවේ |
| 17. | 7.4.4. | I. මෙම ඡේදයෙහි "ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය" යන්න "යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය" ලෙස සංශෝධනය විය යුතු වේ.<br>II. ඉවත් කරන්න. |

| | | |
|---|---|---|
| 18. | 7.4.5. | අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :<br><br>ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර නිවේදනයක් මඟින් දැන්වීම් ප්‍රසිද්ධියට පත් කිරීම මඟින් හෝ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් ගැසට් නිවේදනයක් හරහා ප්‍රසිද්ධියට පත් කිරීම. |
| 19. | 08 | කාර්යක්ෂමතා කඩඉම :<br><br>ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සේවා ව්‍යවස්ථාව අනුව විය යුතු ය. |
| 20. | 09 | රාජ්‍ය භාෂා ප්‍රවීණතාව :<br><br>ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සේවා ව්‍යවස්ථාව අනුව විය යුතු ය. |
| 21. | 10 | ශ්‍රේණි උසස් කිරීම : අදාළ නොවේ. |
| 22. | 11 | තනතුරුවලට පත් කිරීම : 7.4.4 අනුව බඳවා ගන්නා නිලධාරීන් |
| 23. | 14 | ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය :<br><br>ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සේවා ව්‍යවස්ථාව අනුව විය යුතු ය. |
| 24. | 16 | මෙම බඳවා ගැනීමේ පටිපාටියෙහි විශේෂයෙන් විධි විධාන සලසා නොමැති කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධි විධාන අදාළ වේ. මෙම බඳවා ගැනීමේ පටිපාටියේ සහ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සේවා ව්‍යවස්ථාවේ විධි විධාන සලසා නොමැති කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ. |
| 25. | 17 | අන්තර්කාලීන විධි විධාන : ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සේවා ව්‍යවස්ථාව අනුව විය යුතු ය. |